(III) ඉහත සියළු ඡේදවල සඳහන් සුදුසුකම් සියල්ල සපුරන බවට, මුල් ලියවිලි සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කල යුතුය.

(IV) අධිකරණයේ පැවැත්වෙන නඩු විභාගයකින් චූදිතයින් / වැරදිකරුවන් වී සිටින හෝ විනයානුකූල දඩුවම් ලබා ඇති, චෝදනා පත්‍ර නිකුත් කර ඇති නිලධාරීන් මේ සඳහා ඉල්ලුම් නොකල යුතුය.

(V) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. වැටුප් පරිමාණය

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාරව, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට අදාල වැටුප් පරිමාණය (මාසික) රු. 88,000-12x2,700-120,400/- ක් වන අතර, උසස්වීම් දින සිට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට අයත් රු. 88,000/- ක (මාසික) ආරම්භක වැටුප් පියවරේ පිහිටුවනු ලැබේ.

04. ලකුණු ලබා දීමේ පරිපාටිය
(ඇමුණුම 01)

05. බඳවාගැනීමේ ක්‍රමය

අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර එහි ප්‍රතිඵල මත සුදුසු නිලධාරියෙකු අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබේ.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ
අමාත්‍යාංශය

2019.05 මස.03.වැනි දින
රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07